**සිකුරාදා දේශනය (ප්‍රකාශනය සහ බෙදා හැරීම පිණිස)**
**දිනය: 1448 රබීඋල් අව්වල් මස 08 /2026 අගෝස්තු 21 වනදා**

# ඉස්ලාමීය ආචාරධර්ම බිඳක්

සියලු ප්‍රශංසා සියලු දේ පිළිබඳ පූර්ණ දැනුමක් ඇති, සියලු මැවීම් ඉතා අලංකාර ලෙස මැවූ, සිය ගැත්තන්ට උසස්ම අයුරින් විනය හා ආචාරධර්ම පුහුණු කළ අල්ලාහ් දෙවියන්ට හිමි වේ. උන්වහන්සේ මෙම ඉස්ලාම් දහම ජීවිතයට අවැසි කිසිදු කාරණයක් අතනොහැර මනාව පාලනය කරන, සෑම චරිත ලක්ෂණයක්ම හා ස්වභාවයක්ම යහපත් මගට යොමු කරන සම්පූර්ණ ජීවන මාර්ගයක් බවට පත් කළේය. අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැති බවත්, උන්වහන්සේට කිසිදු සහකරුවෙකු නොමැති බවත් මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් උන්වහන්සේගේ ගැත්තා සහ දූතයාණන් වන බවට ද, උතුම් වූ යහපත් චරිත ලක්ෂණ පූර්ණ කිරීම සඳහා එවනු ලැබූ, සියුම් ආචාරධර්ම පවා උගන්වා පුහුණු කළ නබිතුමාණන් වන බවට ද මම සාක්ෂි දරමි. අල්ලාහ්ගේ ශාන්තිය සහ ප්‍රශංසාව එතුමාණන්ටත්, එතුමාණන්ගේ පවුලේ අයටත්, සහචරයින්ටත් වැඩිවැඩියෙන් හිමි වේවා!

අල්ලාහ්ගේ ගැත්තනි, ඔබලා අල්ලාහ්ට බියභක්තික වන්න (තක්වා ඇති කරගන්න). ජාතීන් සහ සමාජයන් හඳුනාගනු ලබන්නේ ඒවා සතු අධික ධන සම්පත්වලින් හෝ උසස් ගොඩනැගිලිවලින් නොව ඒවායේ උසස් චරිත ලක්ෂණ සහ යහපත් ආචාරධර්ම තුළින් බව වටහා ගන්න.

*"ජාතීන් රඳා පවතින්නේ උසස් චරිත ලක්ෂණ පවතින තාක් පමණි. ඔවුන්ගේ චරිත ලක්ෂණ නැති වී ගියහොත්, ඔවුන් ද විනාශ වී යනු ඇත."*

එබැවින් පුද්ගලයෙකුගේ හැසිරීම යනු ඔහුගේ හදවතේ කඩතොලු පෙන්වන කැඩපතක් වැනි ය. තවද ඔහුගේ රුචිකත්වය හා යහපත් හැසිරීම යනු ඔහුගේ අභ්‍යන්තර හෘදසාක්ෂියේ ප්‍රතිබිම්බය යි.

*“නුඹලා සියලු දෙනා අල්ලාහ් වෙත යළි හැරී යන දිනයේ දඬුවමට නුඹලා බිය වනු. එදින නුඹලා ඔහු ඉදිරියේ සිටගෙන සිටිනු ඇත. පසු ව සෑම ආත්මයක්ම ඔහු ඉපැයූ හොඳ නරකට අනුව ප්‍රතිඵල පිරිනමනු ලබනු ඇත. ඔවුන් ඉපැයූ යහපත් කුසල් කිසිවක අඩුවක් ඇති කරමින් හෝ ඔවුන් සිදු කළ නපුරුකම් සඳහා වූ දඬුවමට වඩා කිසිවක් වැඩි කරමින් හෝ ඔහු අසාධාරණ තත්ත්වයට පත් නොකරනු ඇත”*

[අල්-බකරා: 281]

**මුස්ලිම්වරුනි!** මෙම දහමේ ඇති අතිශය පුදුම සහගත මෙන්ම විශේෂිතම කරුණ නම්, එය මහජන හා ප්‍රබල ගැටලු විසඳීමෙන් පමණක් සෑහීමකට පත් නො වීමයි. ඒ වෙනුවට, එය මිනිසාගේ එදිනෙදා රහසිගත පුරුදු සහ සියුම් ක්‍රියාකාරකම් දක්වා ම විහිදී ගොස්, ඒවා ඉතා අලංකාර ලෙස ගොඩනගා ඇත. අවසානයේ මුස්ලිම්වරයෙකුගේ මුළු ජීවිතය ම යහපත් ආචාරධර්මවලින් පිරී ඉතිරී ගියේය.

- **වන්දනාමාන කටයුතුවල දී**
- **එදිනෙදා ගනුදෙනුවල දී**
- **කතාබහ කිරීමේ දී**
- **ආහාර ගැනීමේ දී**
- **නිදාගැනීමේ දී**
- **වැසිකිළි භාවිතය සහ ශාරීරික අවශ්‍යතා ඉටු කරගැනීමේ දී පවා**

සල්මාන් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් වාර්තා වේ:

*කෙනෙක් එතුමාගෙන් මෙසේ ඇසීය: "ඔබගේ නායකයා (නබිතුමා) ඔබලාට සියලු දේ කරන ආකාරය උගන්වන බව මම දකිමි, අවසානයේ වැසිකිළියට යන ආකාරය පවා උගන්වන්නේද?!"*
*ඊට සල්මාන් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පිළිතුරු දුන්නේය: "ඔව්, නියත වශයෙන්ම, ඔබ ඊට සිනාසුණත් කමක් නැත. නබිතුමා අපගෙන් කෙනෙකු වැසිකිළියට යන ආකාරය පවා උගන්වයි. එතුමා අපට පහත දේ තහනම් කළේය:*

- ***ශාරීරික අවශ්‍යතා ඉටුකරන විට කිබ්ලාව (මක්කම දෙස) දෙසට මුහුණ ලෑම හෝ පිටුපෑම***
- ***දකුණු අතින් පිරිසිදු කිරීම***
- ***සතුන්ගේ අසූචි හෝ ඇටකටු භාවිතයෙන් පිරිසිදු කිරීම***
- ***ගල් කැට තුනකට වඩා අඩුවෙන් පිරිසිදු කිරීම"***

[මුස්ලිම් සහ අහ්මද් යන ග්‍රන්ථවල වාර්තා කර ඇත, මෙම පාඨය අහ්මද් ග්‍රන්ථයෙනි]

මෙම දහම වාඩිවන ආකාරය, කතාකරන ආකාරය, පමණක් නොව කිවිසුම් අරින ආකාරය, අප්‍රසන්න ලෙස ඇනුම් අරින ආකාරය සහ ඉතා සුළු අවස්ථාවල දී පවා අන් අයට හිංසා පීඩා නොකර සිටින ආකාරය පවා ඔබට උගන්වන දහමකි!

එසේ නම් මෙයට වඩා පූර්ණත්වයක් තවත් කොයින්ද?! මෙයට වඩා අර්ථවත් හා බලපෑම්සහගත අධ්‍යාපනයක් හා හික්මවීමක් තවත් කොයින්ද?

**අල්ලාහ්ගේ ගැත්තනි!** නියත වශයෙන්ම ඉස්ලාම් දහමේ එන ආචාරධර්ම යනු ව්‍යාජ බාහිර පෙනුමක් හෝ තාවකාලික රංගනයක් නොවේ. ඒ වෙනුවට එය මිනිස් ආත්මයන් මැන බලනු ලබන, මිනිසුන්ගේ සැබෑ ගුණාංග හඳුනාගනු ලබන සංවෘත වන්දනාමානයකි. යමෙක් මෙකී සියුම් කරුණු ගැන සැලකිලිමත් වේ ද, එය ඔහුගේ හදවතේ ජීවමාන බවත්, ආත්මයේ සැහැල්ලු බවත්, ඔහුගේ යහපත් ස්වභාවයත් පෙන්නුම් කරයි. යමෙක් ඒවා සුළු කොට තකන්නේ ද, ඔහු තුළ ඇති නොසැලකිලිමත්කම සහ ඔහුගේ රළු ස්වභාවය එයින් හෙළි වේ. එබැවින්, එදිනෙදා පුරුදු සහ හැසිරීම් යහපත් මගට යොමු කිරීම සඳහා ඉස්ලාම් දහම පැමිණියේය.

එවැනි ආචාරධර්ම අතර **කිවිසුම් ඇරීමේ ආචාරධර්ම** ද එකකි. අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාගෙන් වාර්තා වන පරිදි, නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ:

> *"නියත වශයෙන්ම අල්ලාහ් කිවිසුම ප්‍රිය කරයි, ඇනුම අප්‍රිය කරයි. එබැවින් යමෙකු කිවිසුම් හැර අල්ලාහ්ට ප්‍රශංසා කළහොත් (අල්හම්දුලිල්ලාහ් කීවොත්), එය ඇසෙන සෑම මුස්ලිම්වරයෙකු ම ඔහුට ප්‍රාර්ථනා කිරීම (තෂ්මීත් කිරීම) යුතුකමකි."*

[බුකාරි සහ මුස්ලිම්]

ඉස්ලාම් දහම කිවිසුම් ඇරීම පවා දෙවියන් සිහිපත් කරන අවස්ථාවක් බවට පත් කළ ආකාරයත්, මැවීම් අතර සම්බන්ධතාවයක් සහ කරුණාවක් ඇති කිරීමට එය යොමු කළ ආකාරයත් සිතා බලන්න:

- **කිවිසුම් හරින්නා:** *(අල්හම්දුලිල්ලාහ්)* - ''සියලු ප්‍රශංසා අල්ලාහ්ට හිමි වේ'' යැයි පවසයි.
- **එය ඇසෙන සහෝදරයා:** *(යර්හමුකල්ලාහ්)* - ''අල්ලාහ් ඔබට කරුණා කරත්වා'' යැයි පිළිතුරු දෙයි.
- **නැවත කිවිසුම් හැරි තැනැත්තා:** *(යහ්දීකුමුල්ලාහු ව යුස්ලිහු බාලකුම්)* - ''අල්ලාහ් ඔබට යහමග පෙන්වා ඔබේ සිතුවිලි හා තත්ත්වය යහපත් කරත්වා'' යැයි ප්‍රාර්ථනා කරයි.

මේවා ඉතා සරල වචන වුව ද, ඒවා එකමුතුකම ගොඩනඟන අතර ආදරය ප්‍රගුණ කරයි.

එමෙන්ම කිවිසුම් ඇරීමේ තවත් ආචාරධර්මයක් නම්: මිනිසා තමාගෙන් අන් අයට වන හිංසාව වැළැක්වීම යි. එනම් කිවිසුම් අරින විට තමාගේ ශබ්දය අඩු කර ගැනීම සහ මුඛය වසා ගැනීම යි.

> *"නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් කිවිසුම් අරින විට තමාගේ අතින් හෝ රෙදි කඩකින් මුහුණ වසා ගත් අතර, ඒ මගින් තමාගේ ශබ්දය පහත් කර ගත්තෝය."*

[අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) ගෙන් වාර්තා වූ මෙය තිර්මිදි ග්‍රන්ථයේ සඳහන් වන අතර එහි සත්‍යතාව තහවුරු කර ඇත]

**විශ්වාසවන්ත ජනයිනි!** ඉස්ලාමීය ආචාරධර්ම අතරින් තවත් එකක් නම්: **ඇනුම් ඇරීමේ ආචාරධර්මය.**

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාගෙන් වාර්තා වන පරිදි, නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ:

*"ඇනුම් ඇරීම ෂෙයිතාන්ගෙන් සිදු වන්නකි. එබැවින් ඔබගෙන් කෙනෙකුට ඇනුමක් ආ විට, ඔහු හැකි තරම් එය වළක්වා ගනීවා! මන්ද ඔබගෙන් කෙනෙකු ඇනුම් අරිමින් 'හා' (කියා ශබ්ද) කළහොත්, ෂෙයිතාන් සිනාසෙයි."*

[බුකාරි සහ මුස්ලිම්]

ඇනුම් ඇරීම ෂෙයිතාන්ට සම්බන්ධ කර පවසන ලද්දේ, එය කම්මැලිබව, මන්දගාමීබව සහ උදාසීනබව පෙන්නුම් කරන බැවිනි. නමුත් අල්ලාහ් ප්‍රිය කරන කිවිසුම් ඇරීම ඊට හාත්පසින්ම වෙනස් ය; මන්ද එය බොහෝ විට ආත්මයේ සැහැල්ලු බව, උද්‍යෝගය සහ ප්‍රබෝධමත් බව පෙන්නුම් කරයි.

එබැවින් මුස්ලිම්වරයෙකුට සුදුසු වන්නේ:

- **ඇනුම් ඇරීමට තුඩුදෙන හේතූන් වළක්වා ගැනීම**
- **තමාගේ ගෞරවය ආරක්ෂා වන පරිදි සහ පෙනුම කැත නොවන පරිදි ඇනුම් ඇරීමේ දී කටයුතු කිරීම**

තවද සියුම් ආචාරධර්ම අතර **උගුරෙන් ශබ්ද පිටවීමේ (රාමතෙල්/ ගුඩුස් යැවීම) ආචාරධර්ම** ද වේ. මෙය බොහෝ විට සිදු වන්නේ බඩ පිරුණු විට ආමාශයේ ඇති වාතය මුඛය හරහා ශබ්දයක් සහිත ව පිටවීමෙනි. යමෙකු තමා වටා සිටින අය ගැන කිසිදු තැකීමක් නොකර, එම අප්‍රසන්න ශබ්දය සිතාමතාම පිට කරන විට අන් අයට මහත් හිංසාවක් සිදු වේ.

ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමාගෙන් වාර්තා වේ:

*නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් අසල සිටි මිනිසෙකු මෙසේ ශබ්ද නගා රාමතෙල් පිට කළ විට, නබිතුමාණන් එතුමාට, ''ඔබගේ එම ශබ්දය අපගෙන් වළක්වා ගන්න (අපට හිංසා නොවන සේ එය වළක්වා ගන්න)'' යැයි පැවසූහ.*

[තිර්මිදි]

මෙසේ නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ හැසිරීම් නිවැරදි කිරීම සහ එදිනෙදා පුරුදු යහපත් මගට යොමු කිරීම එක් තැනකට එකතු කළෝය. මන්ද, ශබ්ද නගා රාමතෙල් පිටකිරීම තහනම් කිරීම යනු ඊට මුල් වන ප්‍රධාන හේතුව වන **අධික ලෙස බඩ පිරෙන්නට ආහාර ගැනීම** වළක්වා ගැනීම යි.

මික්දාම් ඉබ්නු මඃදී කරිබ් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් වාර්තා වේ:
අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) මෙසේ පවසනු මම ඇසුවෙමි:

*"මිනිසා තමාගේ බඩට වඩා නරක වෙනත් කිසිදු භාජනයක් පුරවා නැත. කොන්ද කෙළින් තබා ගැනීමට ප්‍රමාණවත් වන ආහාර පිඩු කිහිපයක් මිනිසාට සෑහේ. යම් හෙයකින් ඊට වඩා ආහාර*

*ගැනීමටම අවශ්‍ය නම්: තුනෙන් පංගුවක් ආහාර සඳහා ද, තුනෙන් පංගුවක් පානයන් සඳහා ද, ඉතිරි තුනෙන් පංගුව හුස්ම ගැනීම සඳහා ද වෙන් කරගනීවා!"*

[තිර්මිදි ග්‍රන්ථයේ වාර්තා කර ඇති අතර එහි සත්‍යතාව තහවුරු කර ඇත]

අරාබිවරුන් අතර ද මෙවැනි කියමනක් විය:

*"ආමාශය පිරී ගිය විට, නුවණ හා සිතීමේ ශක්තිය අක්‍රිය වී යයි"*

මම මගේ මෙම වචන පවසා, මගේ ද ඔබගේ ද සියලු පාපයන්ට අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිමි. ඔබ ද උන්වහන්සේගෙන් සමාව අයැ ද, උන්වහන්සේ වෙතට ම පශ්චාත්තාප වන්න (තව්බා වන්න). නියත වශයෙන්ම උන්වහන්සේ අතිශයින් ක්ෂමා කරන්නා ද, අපරිමිත කරුණාවන්තයා ද වන සේක.

## දෙවන දේශනය (දෙවන කුත්බාව)

සියලු ප්‍රශංසා අල්ලාහ්ට හිමි වේ. ඒ ප්‍රශංසාව බහුල වූ ද, පිවිතුරු වූ ද, ප්‍රශංසාවකි. අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැති බවට මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් උන්වහන්සේගේ ගැත්තා සහ දූතයාණන් වන බවට ද මම සාක්ෂි දරමි.

අල්ලාහ්ගේ ගැත්තනි! අල්ලාහ්ට හිමි නිසි බියභක්තියෙන් (තක්වාවෙන්) උන්වහන්සේට බිය වන්න. රහසිගතව මෙන්ම ප්‍රසිද්ධියේ ද උන්වහන්සේගේ නිරීක්ෂණයට යටත්ව කටයුතු කරන්න. නියත වශයෙන්ම ඔබලා සියල්ලන්ම උන්වහන්සේ වෙතට එකතු කරනු ලබන බව මතක තබා ගන්න.

**ආශීර්වාද ලත් ජනයිනි,** ඉස්ලාම් දහම සාමාන්‍ය අවස්ථාවල දී පවා මෙකී හැසිරීම් යහපත් මගට යොමු කර ඇත්නම්, අල්ලාහ්ගේ නිවෙස් (මස්ජිද් තුළ ඒවා කෙරෙහි සැලකිලිමත් වීම වඩාත් අනිවාර්ය මෙන්ම ශ්‍රේෂ්ඨ වේ. මන්ද මස්ජිදයන්ට හිමි උතුම් ගෞරවයක් සහ ශ්‍රේෂ්ඨත්වයක් ඇත. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

*මෙම පහන දේවස්ථානවල දැල්වෙයි. එහි ප්‍රමාණය හා එහි ගොඩනැගිල්ල උසස් කරන මෙන් ද අදාන් දික්ර් සලාත් වැනි ක්‍රියාදාමයන් තුළින් ඔහුගේ නාමය එහි මෙනෙහි කරන මෙන් ද, දහවල ආරම්භයේ හා එහි අවසානයේ අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා එහි සලාත් නැමදුම් කරන මෙන් ද අල්ලාහ් නියෝග කළේය. මිනිසුන් පිරිසකි. ඔවුන් ශුවිශුද්ධයාණන් වන අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් හෝ සලාතය පූර්ණ අයුරින් විධිමත්ව ඉටු කිරීමෙන් හෝ සකාතය එයට අදාළ ස්ථාන වෙත පිරිනැමීමෙන් හෝ ඔවුන්ගේ ව්‍යාපාරික ගනුදෙනු ඔවුන් වෙනතකට යොමු නොකළ පිරිසකි. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය ගැන ඔවුහු බියවෙති. දඬුවමින් මිදීමේ ආශාව හා ඒ ගැන වූ බිය අතර හදවත් දෝළනය වෙමින් පවතින; එහිදී කුමන දිශාවකට බැල්ම හෙළිය යුතු දැයි පෙරළෙමින් පවතින දිනයකි.*

[අන්-නූර්: 36 - 37]

නමුත් අද මස්ජිදයන් තුළ අවධානයට ලක් නොවන කෙතරම් අපහසුතාවයට පත්කිරීම් අප දකිනවාද! මුඛය වසා නොගෙන සහ ශබ්දය පහත් නොකර කරන කිවිසුම් ඇරීම්, ඇනුම් ඇරීම් සහ ශබ්ද නගා රාමතෙල් පිටකිරීම් ඒ අතර වේ. මස්ජිදය යනු ශරීර අවයවයන් ශාන්ත විය යුතු, හදවත් භක්තියෙන් පිරී යා යුතු ස්ථානයකි! එසේ නම් මිනිසුන්ගේ සභාවන්හි දී ආචාරධර්ම රැකගෙන, සියලු මිනිසුන්ගේ හිමිකරුවාණන් වන අල්ලාහ්ගේ නිවස තුළදී එය අමතක කර දැමීම සාධාරණද?!

**විශ්වාසවන්තයිනි!** මස්ජිදයට ගෞරව කිරීමේ තවත් එක් ආකාරයක් නම්: අන් අයව පහත් කරන හෝ අප්‍රසන්නතාවයට පත්කරන සෑම දෙයකින්ම වැළකී සිටීමත්, වන්දනාමානවල ඇති ප්‍රශස්ත බව හා ශාන්තබව කෙලෙසන සෑම දෙයකින්ම මස්ජිදය පිරිසිදුව තබාගැනීමත්ය.

මස්ජිදය තුළ කුර්ආනය පාරායනය කිරීමේ දී පවා ශබ්දය උසස් කිරීම ඉස්ලාම් දහම මගින් තහනම් කර ඇත්නම්, අප්‍රසන්න කරුණුවල දී ශබ්දය උසස් කිරීම ගැන කවර කතාද?!

අබූ සඊද් අල්-කුද්රි (රළියල්ලාහු අන්හු) තුමාගෙන් වාර්තා වේ:
අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) මෙසේ පැවසූහ:

---

*“දැනගන්න! නියත වශයෙන්ම ඔබගෙන් සෑම කෙනෙකුම තමාගේ පරමාධිපතියාණන් සමඟ පෞද්ගලිකව සංවාදයේ යෙදෙයි (ප්රාර්ථනා කරයි). එබැවින් ඔබගෙන් එක් අයෙකු තවත් අයෙකුට හිංසා නොකරන්නේවා! තවද (කුර්ආන්) පාරායනය කිරීමේදී එක් අයෙකු තවත් අයෙකුට වඩා ශබ්දය උසස් නොකරන්නේවා!”*

---

[අබූ දාවූද්]

තවද සාඉබ් ඉබ්නු යසීද් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් වාර්තා වේ:

---

*“මම මස්ජිදයේ සිටගෙන සිටියදී එක් අයෙකු මා දෙසට කුඩා ගල් කැටයක් විසි කළේය. මම හැරී බැලූ විට, ඔහු උමර් ඉබ්නු අල්-ඛත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා බව දුටිමි. එතුමා මට කතා කොට: ‘ගොස් අර අසල සිටින දෙදෙනා මා වෙත කැඳවාගෙන එන්න’ යැයි පැවසීය.*
*මම එම දෙදෙනා කැඳවාගෙන ආවෙමි.*
*එතුමා ඔවුන්ගෙන්: ‘ඔබලා කවුරුන්ද? - නැතහොත් ඔබලා කොහෙන් ආ අයද?’ යැයි ඇසීය.*
*ඊට ඔවුහු: ‘අපි තාඉෆ් නගරයේ වැසියෝ වෙමු’ යැයි පිළිතුරු දුන්හ.*
*එවිට උමර් (රළියල්ලාහු අන්හු) තුමා: ‘ඔබලා මෙම නගරයේ (මදීනාවේ) වැසියන් වූයේ නම්, මම ඔබලාට දඬුවම් කරමි! ඔබලා අල්ලාහ්ගේ දූතයාණන්ගේ (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) මස්ජිදය තුළ ශබ්දය උසස් කරමින් කතා කරනවාද?!’ යැයි පැවසීය.”*

---

[බුකාරි]

**අල්ලාහ්ගේ ගැත්තනි!** මෙවැනි කරුණුවලදී ආචාරධර්ම සුරැකීම යනු ආත්මයේ දියුණුව හා පරිණතභාවය පෙන්නුම් කරන සලකුණක් මෙන්ම, ජීවමාන හෘදසාක්ෂියක සාක්ෂියකි. මන්ද විශ්වාසවන්ත මුස්ලිම්වරයෙකු තමා වෙනුවෙන් පමණක් ජීවත් නොවේ; ඒ වෙනුවට ඔහු තමා වටා සිටින අය ගැන සැලකිලිමත් වන අතර, ඉතා සුළු දෙයකින් පවා අන් අයට හිංසාවක් සිදු වන්නේ නම් එයින් වැළකී සිටියි.

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හුමා) තුමාගෙන් වාර්තා වන පරිදි, නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ:

*“සැබෑ මුස්ලිම්වරයා යනු, ඔහුගේ දිවෙන් සහ අතින් (වන හිංසාවන්ගෙන්) අනෙකුත් මුස්ලිම්වරුන් ආරක්ෂා වී සිටින තැනැත්තා ය. තවද සැබෑ මුහාජිර්වරයා (හිජ්රත් කළ තැනැත්තා) යනු, අල්ලාහ් තහනම් කළ සියලු දේවලින් අතහැරී වෙන් වූ තැනැත්තාය.”*

[බුකාරි සහ මුස්ලිම්]
දිවෙන් සහ අතින් වන හිංසාවන් තහනම් කර ඇත්තාක් මෙන්ම, අන් අය තුළ අප්‍රසන්නතාවයක් හෝ පීඩාවක් ඇති කරන සෑම දෙයකින්ම හිංසා කිරීම ද තහනම් වේ. එබැවින් මෙම යහපත් ආචාරධර්ම හා සිරිත් විරිත් තමා තුළ වර්ධනය කරගැනීමටත්, අන් අයව ඒ වෙත යොමු කිරීමටත්, මෙම හික්මීම්වලට අනුව තම ආත්මය සකස් කරගැනීමටත් සෑම මුස්ලිම්වරයෙකුටම වගකීමක් ඇත.

- **අල්ලාහ් දෙවියනි,** ඉස්ලාම් දහම ද මුස්ලිම්වරුන්ද බලවන්ත කරනු මැනව! ෂිර්ක් (දෙවියන්ට සහකරුවන් තැබීම) සහ ඊට යොමු වන්නන්ව යහමගට යොමු කරනු මැනව!

- **අල්ලාහ් දෙවියනි,** මුස්ලිම් සහ මුඃමින් (විශ්වාසවන්ත) කාන්තා පිරිමි සියලු දෙනාටම — ඔවුන් අතරින් ජීවත්ව සිටින අයට මෙන්ම මියගිය අයට ද — ක්ෂමාව ලබා දෙනු මැනව!

- **අල්ලාහ් දෙවියනි,** අපගේ පාලකයාණන්ටත් (අමීර්වරයාටත්) ඔටුන්න හිමි කුමරුටත් ඔබගේ යහමගෙහි ගමන් කිරීමට අනුග්‍රහය දක්වන මැනව! ඔවුන්ගේ ක්‍රියාවන් ඔබගේ කීකරුකම සහ තෘප්තිය උදෙසාම පත් කරනු මැනව!

- මෙම රට (කුවේටය) සුරක්ෂිත, ශාන්ත, සරුසාර, සෞභාග්‍යයත්, ආරක්ෂිත මෙන්ම ඊමානයෙන් (විශ්වාසයෙන්) පිරි තැනක් බවට පත් කරනු මැනව! එමෙන්ම සාමකාමී සියලු මුස්ලිම් රටවල් ද එසේම ආරක්ෂා කරනු මැනව!

*ආදර්ශ සිකුරාදා දේශන සම්පාදන කමිටුව*